ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ : මූල්‍ය බුද්ධි ඒකකය

දිනය : **2017 අගෝස්තු 01**

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විසිවන වාර්ෂික සමුළුව**
**කොළඹ, ශ්‍රී ලංකාව - 2017 ජූලි 17 සිට 21 දක්වා**

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විසිවන වාර්ෂික සමුළුව සාමාජික රටවල් 41ක නියෝජිතයන් 408ක් සහ විවිධ අන්තර්ජාතික නිරීක්ෂණ සංවිධාන රැසක නියෝජිතයින් 24ක ගේ සහභාගීත්වයෙන් 2017 ජූලි මස 15 සිට 21 දක්වා කොළඹදී පවත්වන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමන් සහභාගී විය.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ වංචා හා දූෂණ ක්‍රියාකාරකම්, මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතුළු අනෙකුත් වැරදි ක්‍රියා වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව ජාතික වශයෙන් කැපවී ක්‍රියා කරන බවට අතිගරු ජනාධිපතිතුමන් සහ ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමන් මෙහිදී අවධාරණය කරන ලදී. තවද, මේ සඳහා කැපවී වැඩකරන දේශීය මෙන්ම විදේශීය පාර්ශවයන් අතර ශක්තිමත් සහයෝගීතාවයක් පවත්වා ගැනීමේ ඇති අවශ්‍යතාවයද අතිගරු ජනාධිපතිතුමන් විසින් මෙහිදී අවධාරණය කෙරිණි.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම 1997 වසරේදී තායිලන්තයේ බැංකොක්හිදී රටවල් 13ක මූලිකත්වයෙන් ආරම්භ කරන විට එම ආරම්භක සාමාජිකයන් අතර

ශ්‍රී ලංකාවද විය. මූල්‍ය කාර්ය සාධක බලකායට සමගාමීව පිහිටුවා ඇති විශාලතම කලාපීය සංවිධානය ලෙස මෙම කණ්ඩායම සිය සාමාජික රටවල මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 ක්‍රමවත් අයුරින් ස්ථාපනය කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණය කරනු ලබයි.

මෙවර පවත්වන ලද වාර්ෂික සමුළුවේදී රටවල් 31ක මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ ඇගයීම් වාර්තා සහ පසුවිපරම් වාර්තාවන් සාකච්ඡාවට ලක් කරන ලද අතර එම රටවල හඳුනාගත් දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාකාරී සැළසුම්වලට අනුමැතිය ලබාදීමද සිදු විය. තවද, සාමාජික රටවල් අතර බුද්ධිමය තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමද මෙහිදී සිදු වූ අතර ශ්‍රී ලංකාවද භූතාන සහ චීන මූල්‍ය බුද්ධි ඒකකයන් සමඟ අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹෙන ලදී.

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැලැක්වීමේ ක්‍රියාමාර්ග, පවත්වා ගතයුතු ආයතනිකමය තත්ත්වයන්, නීතිය බලාත්මක කිරීමේදී සහ නඩු පැවරීම්වලදී මතුවන ගැටළු සහ අපරාධ ක්‍රියාවන් තුලින් උපයාගන්නා ලද මුදල් හා වත්කම් අත්හිටුවීම හා රාජසන්තක කිරීමට අදාලව ජාත්‍යන්තර වශයෙන් අන්‍යෝන්‍ය නීතිමය සහාය ලබා ගැනීම ආදිය සඳහා රටවල් අතර එකඟතාවයන් ඇතිකර ගැනීම ආදිය පිළිබඳ මෙම සමුළුවේදී සාකච්ඡා කරන ලදී. තවද, මෙම සමුළුව හරහා සාමාජික රටවලට අවශ්‍ය තාක්ෂණික සහාය සහ පුහුණුව ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීමට හැකියාව ලැබුණු අතර, මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ මෑත කාලීන නැඹුරුවීම් සහ ඒ සමඟ බැඳී ඇති අවදානම් තත්ත්වයන්ට සහ උපාය මාර්ගයන්ට අදාල පර්යේෂණවල ප්‍රතිඵල පිළිබඳව සාමාජික රටවල් දැනුම්වත් කිරීමටද හැකි විය.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විධායක කමිටු රැස්වීම ඇතුළුව උතුරු ආසියාව, ගිණිකොනදිග ආසියාව, ශාන්තිකර කලාපය, දකුණු ආසියාව වැනි උප කලාපීය කණ්ඩායම් මෙන්ම කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ එකතුවෙන් සැදුම්ලත් උප කලාපීය කණ්ඩායමට අදාල රැස්වීම්ද මෙම සතිය තුළ පැවැත්වුනි. වාර්ෂික සමුළුවේ පෙර සැසිවාරයන් 2017 ජූලි 15-16 දෙදින තුළදී පවත්වන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය, මත්ද්‍රව්‍ය සහ අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන යුරෝ-ආසියානු කණ්ඩායම ආදිය නියෝජනය කරමින් පැමිණි අන්තර්ජාතික නිරීක්ෂකයන් වාර්ෂික සමුළුවේ මූලික පරමාර්ථයන් ලඟා කර ගැනීම සඳහා වන අදාල සැසිවාරයන්ට ඉතා ක්‍රියාකාරී අන්දමින් සහභාගී වූහ.

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ 20වන වාර්ෂික සමුළුව 2017 ජූලි 21වන දින ඉතා සාර්ථක අයුරින් නිමා විය.**






